**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 25 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.61,480 ක වියදමින් මිලදී ගෙන තිබුණු ස්ථාවර වත්කම්, ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, පුස්තකාල පොත් මිලදී ගැනීමේ දී ලැබී තිබුණු රු.116,473 ක වට්ටම් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ රු.139,833 ක් වූ උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.1,712,708 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.3,880,388 ක දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.68,189,265 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

(i) රු.2,186,457 ක් වූ රජයේ ආධාර ගිණුමේ ශේෂය සහ රු.37,215,292 ක් වූ ප්‍රාග්ධන ණයහිමි ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ii) විවිධ තැන්පතු ශේෂයට ඇතුළත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු රු.15,525 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.137,895,235 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ, මෝටර් රථ හා කරත්ත, ලී බඩු හා සවිකිරීම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයද, එකතුව රු.108,048,450 ක් වූ ණයගැති සහ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් විධිමත් පරිදි පවත්වන ලද ණයගැති හා ණයහිමි ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථද, රු.3,146,820 ක් වූ සේවක ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තා යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.10,331,101 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,379,205 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,951,896 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන ආදායම රු.20,000,000 ක් සහ ප්‍රාග්ධන වියදම රු.26,100,000 ක් ලෙස ඇස්තමේන්තු ගතකර තිබූ නමුත්, ආදායම ඉක්ම වූ වියදම් සඳහා මුදල් උපයාගන්නා ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමේ සියයට 15 ක අඩුවීමක් පෙන්නුම් කළද, පුනරාවර්තන ආදායමින් සියයට 82 ක් තරම් පුනරාවර්තන

වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| **වර්ෂය** | **මුළු පුනරාවර්තන ආදායම්** | **ආදායම් ආධාර මුදල්** | **ස්වයං උත්පාදන ආදායම්** | **මුළු පුනරාවර්තන වියදම්** | **ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා ගිය පුනරාවර්තන වියදම** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 56,285,585 | 25,468,240 | 30,817,345 | 45,954,484 | 15,137,139 |
| 2014 | 40,991,555 | 18,658,331 | 22,333,224 | 39,612,350 | 17,279,126 |
| 2013 | 43,069,914 | 12,492,108 | 30,577,806 | 30,408,965 | (168,841) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සභාවේ ආදායම් ආධාර ලැබීම් වල අඛණ්ඩ වර්ධනයක් මෙන්ම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම් වලද වර්ධනයක් පෙන්නුම් කෙරින.

(ii) සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වැඩි වී තිබුණු නමුත්, එම තත්ත්වය හඳුනාගෙන වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා රු.15,137,139 ක පුනරාවර්තන වියදම් උද්ගත වී තිබුණි.

(iv) සභාවට ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොමැති බව පෙන්නුම් කෙරේ. එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව විගණනයේ අදහසයි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේදී අය කරගත යුතුව තිබුණු රු.190,374 ක් වූ අක්කර බදු මුදලින් අය කරගෙන තිබුණේ රු.671 අවම අගයකි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3.2** බදු කුලී

---------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව තිබූ රු.460,604 ක කුලී අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.

**2.3.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.11,591,945 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.2,242,302 ක් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 05 ක පුරප්පාඩු 07 ක් පැවැති අතර, අනුමත සංඛ්‍යාව ඉක්ම වූ අතිරික්ත සේවක සංඛ්‍යාව 13 ක් විය. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අය වියයුතු එකතුව රු.83,230 ක් ද සේවය අතහැර ගිය, විශ්‍රාමගිය සහ මිය ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.40,374 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදීත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි1645 හා 1646 ප්‍රකාර සමාලෝචිත වර්ෂයේ දී සභාවට අයත් වාහන 17 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.2** **බටපොල අදාහනාගාර භූමිය නඩත්තුව**

---------------------------------------

බටපොල ආදාහනාගාර භූමිය ශුද්ධ කිරීම හා පස් කැපීම වෙනුවෙන් 2015 වර්ෂය තුළදී රු.754,336 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කර්මාන්ත සම්බන්ධව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 169 හා 170 වගන්ති ප්‍රකාරව ඇස්තමේන්තු සකස් කර, සභා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ට අනුකූල නොවී සභාව විසින් ඉහත කර්මාන්තය වෙනුවෙන් සේවා සැපයුම්කරු තෝරා ගෙන තිබූ අතර, රීති 179 ට අනුකූලව කර්මාන්තය සම්බන්ධව සේවා සැපයුම්කරු සමඟ කිසිඳු ගිවිසුමකටද එළඹී නොතිබුණි.

(ඇ) කර්මාන්තය සඳහා JCB යන්ත්‍රය හා ස්කැවේටර් යන්ත්‍ර යෙදවීමේ දී කිසිඳු තාක්ෂණ නිලධාරියෙකුගේ අධීක්ෂණයක් සිදු වී නොතිබුණු බව තාක්ෂණ නිලධාරීගේ පැමිණීමේ ලේඛන, ඉදිරි වැඩසටහන් හා පසු වැඩසටහන් අනුව තහවුරු විය.

(ඈ) සේවා සැපයීමට අදාළව ඉදිරිපත් කර තිබුණු කිසිඳු බිල්පතක වැඩ පරීක්ෂකවරයාගේ නම යොදා නොතිබුණු අතර, බිල්පත් 41 ක් සඳහා කාර්මික නිලධාරී විසින් අදාළ කාර්ය ඉටුකිරීම පිළිබඳව සහතික කිරීමකින් තොරව අත්සන් යොදා තිබුණද, එදින කාර්මික නිලධාරියා සේවයට පැමිණ නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.10,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 04 ක එකතුව රු.5,558,771 ක ඉතිරිවීම්ද, වියදම් විෂයයන් 03 ක සීමාවන් ඉක්මවා රු.8,255,255 ක වියදම්ද, ආදායම් විෂයයන් 02 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් එකතුව රු.73,812 ක්ද, ආදායම් විෂයයන් 05 ක ඉලක්කගත ආදායම් ඉක්ම වූ රු.6,975,416 ක්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, සභාව විසින් පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.420,104 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

---------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**නිෂ්ක්‍රීය වත්කම්**

------------------

සභා භූමියේ දිරාපත් වෙමින් පවතින අත් ට්‍රැක්ටර් 02 ක් හා කැබ් රථයක් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය